# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2023
2025 සැප්තැම්බර් / ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය
(නව නිර්දේශය)

**පුනරුද යුගයේ අවසානයේ සිට දහඅට වන සියවස තෙක් අපරදිග සාහිත්‍ය නිර්මාණ හා විචාර අධ්‍යයනය LTCR 28214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. පුනරුදය හා ප්‍රංශ විප්ලවය යන සිදුවීම් හඳුන්වමින් ලෝකයට ඒවා මඟින් සිදු කරන ලද බලපෑම විග්‍රහ කරන්න.

02. බටහිර වැඩවසම් සමාජයේ බිඳ වැටීම සහ ධනේශ්වර සමාජයේ නැගීම පිළිබඳ සමාලෝචනයක් සපයන්න.

03. නව සම්භාව්‍ය යුගයේ මහා බ්‍රිතාන්‍යයේ සමාජ දේශපාලන සන්දර්භය පිළිබඳ ඔබගේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්න.

04. ජෝන් ඩ්‍රයිඩන් පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ ප්‍රබුද්ධයකු වශයෙන් ඇගයෙන්නේ කවර හෙයින් දැයි විමසන්න.

05. කාලීන විචාර සම්ප්‍රදාය පෝෂණයෙහි ලා ඇලෙක්සැන්ඩර් පෝප් විසින් ප්‍රකාශිත සංකල්ප පිටුබලය සැපයූ ආකාරය පැහැදිලි කරන්න.

06. මානව චරිතයන්හි සංකීර්ණතාව උපහාසාත්මක ව නිරූපණයෙහි ලා වෝල්ටෙයාර් දැක් වූ සාමර්ථ්‍යය විමර්ශනය කරන්න.

07. ගලිවර්ගේ චාරිකා කෘතියෙහි කතුවරයා විසින් උපයුක්ත කලාත්මක ශිල්පීය ලක්ෂණ, තත් ප්‍රබන්ධයෙහි අපූර්වත්වයට තුඩු දුන් ආකාරය සාකච්ඡා කරන්න.

08. රොබින්සන් ක්‍රූසෝ කෘතියෙහි විශ්වීය සාර්ථකත්වයට එහි නිරූපිත කථානායක භූමිකාව තීරක සාධකයක් වූ ආකාරය විභාග කරන්න.

09. **The Deserted Village** කාව්‍යයේ ඡායානුවාදයක් වන පාළුගම කාව්‍යයේ නිර්මාණාත්මක විචිත්‍රතා පිළිබඳ අගයන්න.

10. ධනේශ්වර සමාජ ක්‍රමයෙහි උද්දීප්තිමත් අවධියක රචිත සුසාන කාව්‍යය (The Elegy Written in a Country Church yard) එහි තේමාව, අන්තර්ගතය හා ජීවන දෘෂ්ටිය යන අංගයන්ගෙන් ඉංග්‍රීසි සාහිත්‍යයෙහි විප්ලවීය වෙනසක් සිදු කල ආකාරය විමසන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*****************************